**විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදල - 2016**

**------------------------------------------**

විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදලේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 12 වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 12(5) උප වගන්තිය ප්‍රකාර අරමුදලේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

1.2 **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

**----------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

1.3 **විගණකගේ වගකීම**

**----------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරුකිරීම්ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරුකිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත්වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

2. **මූල්‍ය ප්‍රකාශන**

2.1 **මතය**

මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට විශ්වවිද්‍යාල විශ්‍රාම වැටුප් අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

2.2.1 **ගිණුම්කරණ අඩුපාඩු**

සමාලෝචිත වර්ෂයට අදාල මුළු ආදායම් බදු ප්‍රමාණය රු.11,688,067 ක් ඉකුත් වර්ෂයේ ආදායම් බදු සඳහා අධි වෙන් කිරීම් ගිණුමෙහි වූ රු.13,186,248 ක ශේෂයෙන් හිලව් කර එහි වෙනස වූ රු.1,498,181 ක් පමණක් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ ආදායම් යටතේ දක්වා තිබුණි.

2.3 **නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 97 වගන්තිය ප්‍රකාරව විශ්‍රාම වැටුප් අරමුදල විධිමත් කිරීම, පරිපාලනය කිරීම සහ එහි කළමනාකාරීත්වය සඳහා කොමිෂන් සභාව විසින් නියමාවලි සකස් කර නොතිබුණි.

3. **මූල්‍ය සමාලෝචනය**

3.1 **මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.588,520,971 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.507,289,450 ක් වීමෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.81,231,521 ක් හෙවත් සියයට 16 කින් වර්ධනය වී තිබුණි. මෙම වර්ධනයට ශුද්ධ ආයෝජන ආදායම රු.82,652,261 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

4. **මෙහෙයුම් සමාලෝචනය**

4.1 **කාර්යසාධනය**

විශ්වවිද්‍යාල ස්ථිර සේවකයින් සඳහා විශ්‍රාම වැටුප් ක්‍රමයක් පිහිටුවීමට විශ්‍රාම වැටුප් අරමුදල පිහිටුවා තිබූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට රු.6,395,517,956 ක ශේෂයක් සහිතව සාමාජිකයින් 13,173 කින් සමන්විත විය.එහි විශ්‍රාම වැටුප් ලබන විශ්‍රාමිකයින්ගේ සංඛ්‍යාව 222 ක් වූ අතර ඔවුන් සඳහා සමාලෝචිත වර්ෂය තුළ ගෙවා තිබූ විශ්‍රාම වැටුප් මුදල රු.38,825,270 ක් විය.

5. **පද්ධති හා පාලනයන්**

**-------------------------**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ලේකම්වරයා වෙත වරින් වර යොමුකරවන ලදී. ගිණුම්කරණ ක්ෂේත්‍රය පිළිබඳව විශේෂ අවධානය යොමු කළ යුතුය.